# ඉලක්ක ගත කාර්ය භාරයන් සමුදායක් තුළින්
# තිරසාර පරිසරයක් ගොඩනගමු

ටී. එම්. අනුරුද්ධ තෙන්නකොන්
පරිසර කළමනාකරණ නිලධාරි
වන සම්පත් අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය



**ලෝක ඉතිහාසයේ හැත්තෑව දශකයේ හමුවන ප්‍රධාන සන්දිස්ථානයක් ලෙස 1972 වසරේ පැවති මිනිසා සහ පරිසරය පිළිබඳ සමුළුවත් එයින් එළි දක්වන ලද මූලධර්ම 26ක් සහිත පරිසරය සහ සංවර්ධනය පිළිබඳ ස්ටොක්හෝම් ප්‍රකාශණයක් හැඳින්විය හැක. ආර්ථිකමය අපේක්ෂාවන් අතරට පරිසරය පිළිබඳ සංකල්පයන් එක්කල අවස්ථාව ලෙස මෙම සමුළුව ඉතිහාස ගතවේ. සංවර්ධන ක්‍රියාදාමයන් සමග පරිසරය පිළිබඳ සංකල්පයන් දශක දෙකක නිදහස් ගලායාමකට පසු අවතීර්ණවන 90 දශකය හුදෙක් සංරක්ෂණයෙන් බැහැරට ගිය පරිසරයේ තිරසාර භාවිතය, ප්‍රතිලාභ සමාකාරව බෙදාහදා ගැනීම, ජන කොටස් අතර සමාන හා සාධාරනත්වය මෙන්ම ගෝලීය පාරිසරික අර්බුධ සම්බන්ධයෙන් ජගත් අවධානය අවදි කරන කාලයත් වන්නේ 92 වසරේ රියෝ සමුළුවත් එයින් එළි දකින පාරිසරික සම්මුති හා සන්ධාන සමගින් හා ඒ හා පාර්ශව ගතවන රටවල සක්‍රිය ක්‍රියාකාරීත්වය නිසාය.**

බ්‍රසීලයේ රියෝ ද ජනීරෝ හි 1992දි පැවති මිහිකත සමුළුවේදී ප්‍රකාශයට පත්කල 21වන සියවසේ න්‍යාය පත්‍රය මගින් ප්‍රධාන අංශ 4ක් යටතේ ක්‍රියාකාරි සැලසුමක් ඉදිරිපත් කරන ලදි. මෙහි දෙවන අංශය මගින් සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය කේන්ද්‍ර කරගනිමින් ජෛව විවිධත්ව සංරක්ෂණයට අදාළව ක්ෂේත්‍ර ගනනාවක් ඔස්සේ ක්‍රියාත්මක විම සඳහා සැලසුම් ඉදිරිපත්කර ඇත.

2000 වසරේ සැප්තැම්බර් 25දින එවකට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දැරූ රාජයන් 189ක් මගින් වසර 15ක් තුළ එනම් 2015 වන විට සපුරා ගතයුතු ඉලක්කයන් 08ක් "සහශ්‍ර සංවර්ධන ඉලක්ක" ලෙස ප්‍රකාශයට පත්කරන ලදී. ඒ යටතේ දිළිදුකම හා සාගින්න පිටුදැකීම, සැමට ප්‍රාථමික අධ්‍යාපනය, ස්ත්‍රී පුරුෂ සමානත්වය, ළමා සෞඛ්‍යය, මාතෘ සෞඛ්‍යය, ඒඩ්ස් පැතිරීම වැලැක්වීම, තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති හරහා ස්වභාවික සම්පත් රැකගැනීම සහ සංවර්ධනය උදෙසා ලෝක ව්‍යාප්ත සහභාගීත්වය යනාදිය හඳුනාගන්නා ලදි.

සංවර්ධනය වෙමින් පවතින මැදි ආදායම් තත්ත්වයේ රටක් වශයෙන් සහ ස්වභාවික සම්පතෙන් සපිරි රටක් වශයෙන් සහශ්‍ර සංවර්ධන ඉලක්ක තුළ අප සාර්ථක ගමනක් පැමින ඇත. අප සතු ඉහළ කෘෂි ජෛව විවිධත්වය, දේශීය අහාර තාක්ෂණය හා සම්බන්ධ පාරම්පරික දැනුම සහ ආගම දහමෙන් පෝෂණය වන සමාජ යහ පැවැත්ම මගින් අකාලිකව සහශ්‍ර සංවර්ධනය කරා ජාතියක් ලෙස අපට පිය මැණිය හැක.

මෙය වඩාත් පැහැදිලි වන්නේ 2015 වසරේ සැප්තැම්බර් 25 වෙනි දින එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලය මගින් සම්මත කරගන්නා ලද "ධරනීය සංවර්ධන ඉලක්ක" 17 විමසීමෙනි. සහශ්‍ර සංවර්ධන ඉලක්කයන්හි කාලය අවසන් වීමත් සමග ලෝකය අලුතෙන් එළඹෙන ධරනීය සංවර්ධණ ඉලක්ක 17 මගින් දිළිදු භාවයේ මූලික හේතු හඳුනාගැනීම හා සියලු ජනතාවන්ට ගැලපෙන සංවර්ධනයක් වෙනුවෙන් වන විශ්වීය අවශ්‍යතාවන් පිළිබඳ කතිකාවක් මෙහෙයවයි.

ධරනීය සංවර්ධන ඉලක්ක වලදී ගැටළුවල තීව්‍රතාවය පිළිබඳ වැඩි අවධානයක් යොමුකර ඇත. මෙයට හොඳම උදාහරණ ලෙස සහශ්‍ර සංවර්ධන ඉලක්කවල අංක 1ක යටතේ වන දිළිඳුකම හා සාගින්න පිටුදැකීම ධරනීය සංවර්ධන ඉලක්ක යටතේ දී අංක 01 හා අංක 02 ලෙස වෙන්කර වෙන වෙනම අවධානය යොමුකර ඇත. අංක 01 මගින් සෑම තැනකම සෑම ආකාරයකම ඇති දිළිඳුකම දුරලීම අපේක්ෂා කරන අතර දෙවන ඉලක්කය යටතේ සාගින්න දුරලා ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීමත්, පෝෂණය ඇතිකිරීමත්, තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීමත් ඉලක්ක කර ඇත. පරිසරය හා සම්බන්ධව මෙම සියලු කාරණා සම්බන්ධ අතර අන්තර්ජාතික ජෛව විවිධත්ව සම්මුතිය වැනි ලියවිලිවල අන්තර්ගත කරුණු ද වේ.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මෙන්ම කාන්තාවන් සවිබල ගැනිවීම ධරනීය සංවර්ධන ඉලක්ක අංක 05 යටතේ දක්වා ඇත. මෙය වර්තමානයේ ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම ඉලක්ක කර ක්‍රියාත්මක වන සෑම ව්‍යාපෘතියකම පාහේ අන්තර්ගත සහ විශේෂ අවධානයට ලක්ව ඇති කරුණකි. සමෝධානික වෙරළ කළමනාකරණ ව්‍යාපෘති වැනි ව්‍යාපෘතිවලදී ද මෙම තත්ත්වය සැලකීම සාධනීය ප්‍රවණතාවයකි.

සැමට පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව තහවුරුකිරීම යන අංක 06 යටතේ වන ඉලක්කය සපුරාලීමට ශ්‍රී ලාංකේයන් ලෙස අප අපරිමිත මෙහෙයක් ඉටු කරමින් ඇත. ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය මෙන්ම වැඩි අවධානයට ලක් නොවන ක්ෂුද්‍ර ජල පෝෂක ස්ථාන සංරක්ෂණය මෙන්ම හායනයට පත් ජල පෝෂක ප්‍රදේශ ප්‍රතිස්ථාපනය කිරීමට පියවර ගෙන ඇත. මෙරට වන ආවරණය භූමි ප්‍රමාණයෙන් 32% දක්වා වැඩි කිරීමේ ප්‍රයත්නයට අප දායකවීම මගින් ගෝලීය ඉලක්ක සපුරාලීමට අපට දායක විය හැක.

නවීන බලශක්තිය වෙත ගමන්කිරීම,තිරසාර පරිභෝජනය හා නිෂ්පාදනය තහවුරු කිරීම, දේශගුණික විපර්යාස හා එහි බලපෑම අවම කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම, ධරනීය සංවර්ධනයට ගැලපෙන ලෙස මුහුද හා සමුද්‍ර සම්පත් තිරසාරව යොදාගැනීම මෙන්ම ඉලක්ක අංක 15 මගින් විශ්ව පාරිසරික පද්ධතිය සුරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා දරාගත හැකි පරිදි පරිහරණය කිරීම ප්‍රවර්ධනය කිරීම. වනාන්තර ධරණීය ලෙස කළමනාකරණය කිරීම සහ භූමිය හා ජෛව විවිධත්වය විනාශවීම නැවැත්වීමට ඉලක්ක කර ඇත.

මෙම ඉලක්ක සැලකීමේදී පරිසරයට වගකියන සහ වඩාත් තිරසාරව පරිසරය භාවිතා කරමින් සංවර්ධන ය කරා එළඹීමක් අපේක්ෂා කරයි. එය හරිත ආර්ථික ක්‍රමය පදනම් කරගෙන එනම් මානව උන්නතිය සහ සමාජ සාධාරනත්වය ප්‍රවර්ධනය කරණ අතර ම පාරිසරික අවදානම අඩු කරමින් සොබා සම්පත නැණවත්ව පරිහරණය කරන ආර්ථික ක්‍රමයකි.

මේ හා සමගාමීව අන්තර්ජාතික ජෛව විවිධත්ව සම්මුතියට අදාළව 2011 වසරේ ජපානයේ අයිචි නගරයේ දී පවත්වන ලද පාර්ශවකරුවන්ගේ සමුළුවේ දී සම්මතකරගත් වසර 10ක් තුල සපුරාගතයුතු (එනම් 2020 දී) ඉලක්කයන් "අයිචි ටාර්ගට්" ලෙස හඳුන්වයි. මෙම ඉලක්ක 20 පහත දැක්වෙන ප්‍රධාන උපාය මාර්ගික අරමුණු 05ක් යටතේ අරමුණු කර ඇත. එනම්,

I ජෛව විවිධත්වය විනාශ වීමට පවතිවන හේතු හඳුනාගැනිම හා රජය හා සමාජය හරහා ජෛව විවිධත්වය අනුප්‍රවාහ ගත කිරීම.

II ජෛව විවිධත්වය මත ඇති ඍජු පීඩනය අඩුකිරීම හා තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම.

III විවිධත්වය, විශේෂ විවිධත්වය සහ පරිසර පද්ධති විවිධත්වයේ සුරක්ෂිතතාවය තුළින් ජෛව විවිධත්වයේ තත්ත්වය වැඩි දියුණු කිරීම.

IV ජෛව විවිධත්වයෙන් හා පරිසර පද්ධති සේවාවන් මගින් සියලු දෙනාට ලැබෙන ප්‍රතිලාභ ඉහල නැංවීම.

V සහභාගීත්ව සැලසුම් කිරීම, දැනුම් කළමණාකරණය සහ ධාරිතා වර්ධනය තුළින් ක්‍රියාවෙහි යෙදවීම් ඉහල නැංවිම.

“අයිචි ටාර්ගට්” යටතේ පරිසර පද්ධතීන් මගින් ලැබෙන පාරිසරික සේවාවන් පිළිබඳ වැඩි අවධානයක් යොමුකර තිබීම වඩාත් වැදගත් කරුණකි. සාමාන්‍යයෙන් පරිසරයේන් ඍජුවම ලැබෙන ප්‍රයෝජන පිළිබඳව ජනතාව උත්සුක උවත් එයට වඩා පුලුල් පරාසයක් හරහා ලැබෙන සමස්ථ පාරිසරික සේවාවන් පිළිබඳ ජනතා අවධානය අඩුය. මෙම තත්ත්වය මගහැරවීමට “අයිචි ටාර්ගට්” වැදගත් මෙහෙයක් ඉටු කරයි.

මෙම ඉලක්කයන් 20 සැලකීමේදී එය සපුරාලීමට තවත් ඉතිරිව ඇත්තේ වසර කිපයක් පමණක් බැවින් ඒ සඳහා වැඩි අවධානයක් යොමු

කිරීම අවශ්‍යය. මෙහිදී ජෛව විවිධත්වය පිළිබඳව ජනතාවගේ ධනාත්මක ආකල්ප ඇතිකිරීමත්, දැනුම කළමනාකරණය කිරීමත් සුවිශේෂීය අංශයන් වේ. එසේම දේශිය ජනතාව, ඔවුන් සතු පාරම්පරිද දැනුම හා ව්‍යවහාරයන් ජෛව විවිධවය තිරසාර භාවිතයට පාදක කරගැනීම කැපීපෙනෙන ලක්ෂණයකි.

සමස්ථ සමාජ ආර්ථික ප්‍රවණතා සහ ගෝලීය පසුබිම හමුවේ ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය උදෙසා නීල හරිත උපාය මාර්ගික දිශානතියකට දැන් යොමුව ඇත. මෙහිදී නීල ආර්ථිකය ලෙස සමුද්‍ර සම්පත පදනම් කරගත් ඉලක්කයන් 10ක් සහ හරිත ආර්ථිකය ලෙස භෞමිත පරිසරය හා සම්බන්ධ සංවර්ධන ඉලක්කයන් 07ක් ද හදුනා ගෙන ඇත.

දිවයිනක් ලෙස මෙරට පිහිටීමත්, නාවික ක්ෂේත්‍ර යේ කලාපීය සංවර්ධනයත් සැලකීමේදී නීල සංවර්ධන ඉලක්ක බෙහෙවින් අපට අදාළ බව පැහැදිලිය. එසේම නවීන ලෝකයත් සමග කරට කර ගමනක් සඳහා හරිත ඉලක්කයන්ද සපුරාලීම වැදගත්වේ . සමස්ථයක් ලෙස ධරනීය සංවර්ධනය යථාර්ථයක් කිරීම සඳහා අද දවසේ පරිසරය සුරැකීමට අප ඉදිරියේ ඇති වගකීම ඉටු කරමු.

